# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2018 අංක 35 දරන මුදල් පනත

---

**[සහතිකය සටහන් කළේ 2018 නොවැම්බර් මස 01 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2018 නොවැම්බර් මස 02 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකි ය.

**මිල :** රු. 28.00 **තැපැල් ගාස්තුව :** රු. 35.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2018 අංක 35 දරන මුදල් පනත**

[සහතිකය සටහන් කළේ 2018 නොවැම්බර් මස 01 වන දින]

එල්.ඩී.—ඕ. 22/2017.

**2003 අංක 25 දරන මුදල් පනත, 2005 අංක 5 දරන මුදල් පනත, 2012 අංක 12 දරන මුදල් පනත, 1995 අංක 16 දරන මුදල් පනත සහ 2015 අංක 10 දරන මුදල් පනත සංශෝධනය කිරීම පිණිස ද; මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද, වාහන හිමිකම් අය බද්ද, වාර්ෂික සමාගම් ලියාපදිංචි කිරීමේ අය බද්ද, ණය ආපසු ගෙවීමේ අය බද්ද, කාබන් බද්ද, දුරකථන සන්නිවේදන කුළුණු අය බද්ද, සහ ජංගම දුරකතන කෙටි පණිවුඩ සේවා මත අය බද්ද, පැනවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඊට සම්බන්ධ හා ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මෙම පනත 2018 අංක 35 දරන මුදල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

I වන කොටස

**2003 අංක 25 දරන මුදල් පනතේ II වන කොටස සංශෝධනය කිරීම**

**2.** (මේ කොටසේ මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 25 දරන මුදල් පනතේ II වන කොටසේ (සංචාරක සංවර්ධන බද්ද පැනවීම) 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 2003 අංක 25 දරන පනතේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) 11 වන වගන්තිය එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන්;

(2) නැවත අංක යොදන ලද (1) වන උපවගන්තියේ දෙවන අතුරු විධානයේ "රුපියල් මිලියන තුනක" යන වචන වෙනුවට "2018 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාල සීමාව සඳහා රුපියල් මිලියන තුනක" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එම උපවගන්තියේ දෙවන අතුරු විධානයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අතුරු විධානය ඇතුළත් කිරීමෙන්;

"එසේම තවදුරටත්, 2019 ජනවාරි මස 1 වන දිනයේ පටන් සහ ඉන් පසුව, රුපියල් මිලියන දොළහක් නොඉක්මවන වාර්ෂික පිරිවැටුමක් හෝ කාර්තුවකට රුපියල් මිලියන තුනක් නොඉක්මවන පිරිවැටුමක් සහිත යම් ආයතනයකින් එකී ආයතනයේ අදාළ පිරිවැටුම මත සියයට 0.5 ක අනුප්‍රමාණයකට එම බද්ද පනවා අයකරගනු ලැබිය යුතු ය.";

(4) නැවත අංක යොදන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

"(2) 2019 ජනවාරි මස 1 වන දිනයේ පටන් සහ ඉන් පසුව, 2005 අංක 38 දරන සංචාරක පනත යටතේ බලපත්‍ර දෙන ලද සෑම ආයතනයකින් ම, සෑම වර්ෂයක් තුළ දී ම එම ආයතනවල පිරිවැටුමෙන් සියයට එකක බද්දක් අයකරගනු ලැබිය යුතු අතර, එම බද්ද සංචාරක සංවර්ධන බද්ද යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ය:

එසේ වුව ද, 2005 අංක 38 දරන සංචාරක පනත යටතේ බලපත්‍ර ලබා දී ඇති සාමාන්‍ය අලෙවි නියෝජිතයන් ඇතුළු සංචාරක නියෝජිතයන්ට ගුවන් ටිකට්පත් විකිණීම මත ලැබෙන කොමිස් මුදලින් එම බද්ද අයකරනු නොලැබිය යුතු ය:

එසේම තවදුරටත්, රුපියල් මිලියන දොළොහක් නොඉක්මවන වාර්ෂික පිරිවැටුමක් හෝ කාර්තුවකට රුපියල් මිලියන තුනක් නොඉක්මවන පිරිවැටුමක් සහිත යම් ආයතනයකින් එකී ආයතනයේ එම පිරිවැටුම මත සියයට 0.5 ක අනුප්‍රමාණයකට එම බද්ද පනවා අයකරගනු ලැබිය යුතු ය."; සහ

(5) එම වගන්තියේ පැතිසටහන ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන පැතිසටහන ආදේශ කිරීමෙන්:—

"සංචාරක සංවර්ධන පනත යටතේ සහ සංචාරක පනත යටතේ බලපත්‍ර ලබා දී ඇති ආයතන මත බද්ද පැනවීම".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය, එහි (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) ලංකා සංචාරක මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්-

(අ) 2005 අංක 38 දරන සංචාරක පනත යටතේ බලපත්‍ර ලබාගෙන ඇති මාර්ගගත සංචාරක නියෝජිතවරුන්ගෙන් එකතු කර ගනු ලැබූ බද්ද සහ 11 වන වගන්තිය යටතේ සියයට 0.5 ක අනුප්‍රමාණයකට එකතු කර ගනු ලැබූ බද්ද හැර, (1) වන උපවගන්තිය යටතේ එකතු කර ගනු ලැබූ බද්ද රඳවා ගැනීම; සහ

(ආ) 2005 අංක 38 දරන සංචාරක පනත යටතේ බලපත්‍ර ලබාගෙන ඇති මාර්ගගත සංචාරක නියෝජිතවරුන්ගෙන් එකතු කරගනු ලැබූ බද්ද සහ 11 වන වගන්තිය යටතේ සියයට 0.5 ක අනුප්‍රමාණයකට එකතු කර ගනු ලැබූ බද්ද ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කිරීම,

කරනු ලැබිය යුතු ය.

(3) ලංකා සංචාරක මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම මුදල් ප්‍රමාණය එකතු කර ගනු ලැබූ දින සිට දින තිහක් ඇතුළත, තත්කාර්යය සඳහා නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකට යම් වාර්තා, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත සපයනු ලැබිය යුතු ය.".

## II වන කොටස

## 2005 අංක 5 දරන මුදල් පනතේ II වන කොටස සංශෝධනය කිරීම

4. 2005 අංක 5 දරන මුදල් පනතේ II වන කොටස (කොටස් ගනුදෙනු බද්ද පැනවීම), එහි 7 වන වගන්තියේ (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 2005 අංක 5 දරන මුදල් පනතේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ආ) 2011 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන නමුත් 2016 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වන යම් කාලසීමාවක් සඳහා සියයට 0.3 ක අනුප්‍රමාණයකට; සහ

(ඇ) 2016 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා සියයට 0.3 ක අනුප්‍රමාණයකට.".

III වන කොටස

**2005 අංක 5 දරන මුදල් පනතේ III වන කොටස සංශෝධනය කිරීම**

2005 අංක 5 දරන පනතේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** (මේ කොටසේ මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2005 අංක 5 දරන මුදල් පනතේ III වන කොටස (ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල බද්ද), එහි 13 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "ඉන්පසු එළඹෙන සෑම අවුරුද්දක් සඳහා ම" යන වචන වෙනුවට "ඉන්පසු 2015 දෙසැම්බර් මස 31 වන දින තෙක් එළඹෙන සෑම අවුරුද්දක් සඳහා ම'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම කොටස මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13අ වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13අ වගන්තිය එහි (1) වන උපවගන්තියේ "එම කොන්ත්‍රාත්කරුට හෝ උපකොන්ත්‍රාත්කරුට 2009 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ගෙවනු ලබන අවස්ථාවක," යන වචන හා ඉලක්කම් වෙනුවට "එම කොන්ත්‍රාත්කරුට හෝ උපකොන්ත්‍රාත්කරුට 2009 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව, නමුත් 2016 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ගෙවනු ලබන අවස්ථාවක," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්, එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අතීතයට බලපෑම.

**7.** මේ පනතේ මේ කොටස මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන, සියලු කාර්ය සඳහා 2016 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

IV වන කොටස

**2012 අංක 12 දරන මුදල් පනතේ IV වන කොටස සංශෝධනය කිරීම**

2012 අංක 12 දරන පනතේ 18අ වගන්තිය සංශෝධනය කිරීම.

**8.** (මේ කොටසේ මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2012 අංක 12 දරන මුදල් පනතේ IV වන කොටස ((235 වන අධිකාරය වූ) රේගු ආඥා පනත, (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනත සහ 1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනත යන පනත්වල විධිවිධාන අදාළ වීමෙන් නිදහස් කිරීම), එහි 18අ වගන්තියේ (1) වන උපවගන්තියේ "නිරත වන යම් ව්‍යවසායක්" යන වචන වෙනුවට "නිරත වන ව්‍යවසායන් හෝ එම උපලේඛනයේ නිශ්චිතව දක්වනු ලබන ඇතැම් ව්‍යවසායන්" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය, එහි 1 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

"1. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත (එකතු කළ අගය මත බදු පනතේ විධිවිධාන අර්ථානුකූලව ශුන්‍ය අනුප්‍රමාණයෙන් යුක්ත කටයුතු වශයෙන් සලකනු ලබන කටයුතු සිදු කරනු ලබන්නා වූ සහ එම පනතේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ සඳහන් සරල කරන ලද එකතු කළ අගය මත බදු යෝජනාක්‍රමය යටතේ දේශීය වශයෙන් භාණ්ඩ හෝ සේවා මිල දී ගැනීම සම්බන්ධයෙන් එම ඡේදයේ විධිවිධාන අදාළ වන්නා වූ ව්‍යවසායක් හැර);".

10. මේ පනතේ මේ කොටස මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය. මේ කොටසේ විධිවිධාන අදාළවීම.

V වන කොටස

**1995 අංක 16 දරන මුදල් පනතේ II වන කොටස සංශෝධනය කිරීම**

11. (මේ කොටසේ මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1995 අංක 16 දරන මුදල් පනතේ 3 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "(අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයක් හෝ වැගන් රථයක් නොවන) සෑම සුඛෝපභෝගී මෝටර් වාහනයක්" යන වචන වෙනුවට "පළමුවෙන් ලියාපදිංචි කරනු ලබන වර්ෂය 2019 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව එළඹෙන (අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයක් හෝ වැගන් රථයක් නොවන) සෑම සුඛෝපභෝගී මෝටර් වාහනයක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. 1995 අංක 16 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "(අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයක් හෝ වැගන් රථයක් නොවන) සෑම අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනයක්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "පළමුවෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

ලියාපදිංචි කරනු ලබන වර්ෂය 2019 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව එළඹෙන (අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයක් හෝ වැගන් රථයක් නොවන) සෑම අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනයක්" වන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "(වැගන් රථයක් නොවන) සෑම අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයක්" යන වචන වෙනුවට "පළමුවෙන් ලියාපදිංචි කරනු ලබන වර්ෂය 2019 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව එළඹෙන (වැගන් රථයක් නොවන) සෑම අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "යම් නිශ්චිත මෝටර් වාහනයක්" යන වචන වෙනුවට "බද්ද ගෙවිය යුතු දිනය 2019 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව එළඹෙන යම් නිශ්චිත මෝටර් වාහනයක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8අ වගන්තිය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8අ වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "යම් නිශ්චිත මෝටර් වාහනයක්" යන වචන වෙනුවට "බද්ද ගෙවිය යුතු දිනය 2019 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව එළඹෙන යම් නිශ්චිත මෝටර් වාහනයක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8ආ වගන්තිය ඇතුළත් කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 8ආ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

"ලියාපදිංචිය අලුත් කරන අවස්ථාවේ දී බද්ද එකතු කළ යුතු බව.

8ආ. (1) බද්ද ගෙවිය යුතු දිනය 2019 ජනවාරි මස 1 වන දින හෝ ඊට පසුව එළඹෙන යම් නිශ්චිත මෝටර් වාහනයකට අදාළව වාර්ෂික ආදායම් බලපත්‍රය අලුත්කරන සෑම ප්‍රාදේශීය ලේකම්වරයකු විසින් ම, වාර්ෂික ආදායම් බලපත්‍රය අලුත්කරන අවස්ථාවේ දී, එම මෝටර් වාහනයේ ලියාපදිංචි අයිතිකරුගෙන් එම බද්දට සමාන මුදල් ප්‍රමාණයක් එකතු කරගෙන එසේ එකතු කර ගත් මුදල් ප්‍රමාණය, කොමසාරිස්-ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු අතර, කොමසාරිස්-ජනරාල්වරයා විසින් එම මුදල් ප්‍රමාණය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බද්ද එකතු කරන සෑම ප්‍රාදේශීය ලේකම්වරයකු විසින් ම එසේ එකතු කර ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරන ලද බද්දට අදාළව කොමසාරිස්-ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් ආකෘතියකින් හා යම් විස්තර ඇතුළත් කරමින් කොමසාරිස්-ජනරාල්වරයා වෙත මාසික වාර්තාවක් යැවිය යුතු ය.

(3) (1) වන උපවගන්තියට අනුව බද්ද එකතු කරන සෑම ප්‍රාදේශීය ලේකම්වරයකු විසින් ම, එසේ එකතු කරන ලද බද්ද ලැබුණු බව කොමසාරිස්-ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් ආකාරයකින් නිසි ලෙස පිළිගනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුව යම් ප්‍රාදේශීය ලේකම්වරයකු විසින් එසේ එකතු කරන ලද යම් බද්දක්, ඒ බද්ද එකී ප්‍රාදේශීය ලේකම්වරයා විසින් එකතු කරන ලද දිනයේ දී, ඒ ලියාපදිංචි අයිතිකරු විසින් කොමසාරිස්-ජනරාල්වරයා වෙත ගෙවනු ලැබූ බවට සලකනු ලැබිය යුතු ය.".

## VI වන කොටස

## 2015 අංක 10 දරන මුදල් පනත සංශෝධනය කිරීම

**17.** (මේ කොටසේ මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2015 අංක 10 දරන මුදල් පනතේ VII වන කොටස (මන්දිර බද්ද) මෙයින් ඉවත් කරනු ලැබේ.

2015 අංක 10 දරන පනතේ VII වන කොටස ඉවත් කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ IX වන කොටස (මෝටර් වාහන ආනයනකරුවන්ගේ බලපත්‍ර ගාස්තුව) 2016 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ IX වන කොටස ඉවත් කිරීම.

## VII වන කොටස

## මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද පැනවීම

**19.** පළමු ලියාපදිංචි කිරීමේ වර්ෂය මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් නියම කරනු ලැබිය හැකි දිනයක හෝ ඉන්පසුව

මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද පැනවීම.

එළඹෙන නිශ්චිතව සඳහන් කරන ලද සෑම මෝටර් වාහනයක් මත ම ඒ නියෝග මගින් නියම කරනු ලබන අනුප්‍රමාණ මත (මේ කොටසේ මින්මතු "බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) "සුඛෝපභෝගී බද්ද" යනුවෙන් හඳුන්වනු ලබන බද්දක් අය කරනු ලැබිය යුතු ය.

ආනයනය කරනු ලබන අවස්ථාවේ දී බද්ද එකතු කිරීම.

**20.** (1) 19 වන වගන්තිය යටතේ නියම කරනු ලබන දිනයේදී හෝ ඉන් පසුව ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන නිශ්චිතව සඳහන් කරන ලද යම් මෝටර් වාහනයක් මත 19 වන වගන්තිය යටතේ ගෙවිය යුතු බද්ද, යම් ලිඛිත නීතියක් ප්‍රකාරව එකී වාහනය සම්බන්ධයෙන් ගෙවිය යුතු ආනයන බදු සමඟ, එම වාහනය ශ්‍රී ලංකා රේගුවෙන් ඉවත් කරගනු ලබන අවස්ථාවේ දී, එකී වාහනය ආනයනය කරන තැනැත්තා විසින් රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

(2) යම් රේගු බද්දක් එකතු කිරීම සහ අයකර ගැනීම සඳහා අදාළ වන (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ වගන්තිය යටතේ බද්ද එකතු කිරීම සහ අයකර ගැනීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

ලියාපදිංචි කරන අවස්ථාවේ දී බද්ද එකතු කිරීම.

**21.** (1) 19 වන වගන්තිය යටතේ නියම කරනු ලබන දිනයට පෙරාතුව ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද හෝ ශ්‍රී ලංකාවේ දී එකලස් කරන ලද නිශ්චිතව සඳහන් කරන ලද යම් මෝටර් වාහනයක් මත 19 වන වගන්තිය යටතේ ගෙවිය යුතු බද්ද, එම වාහනය සම්බන්ධයෙන් පළමු ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කරනු ලබන අවස්ථාවේ දී, එකී වාහනයේ ලියාපදිංචි අයිතිකරු විසින් කොමසාරිස්-ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ එකතු කරන ලද බද්ද කොමසාරිස්-ජනරාල්වරයා විසින් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

ඇතැම් වාහන බදු ගෙවීමෙන් නිදහස් විය යුතු බව.

**22.** මේ කොටසේ සඳහන් කිසිවක්, 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ අර්ථානුකූලව යම් රාජ්‍යයක දූත මණ්ඩලයකට හෝ එම පනත ප්‍රකාරව හඳුනාගත් ජාත්‍යන්තර, බහුපාර්ශ්වික හෝ

ද්විපාර්ශ්වික සංවිධාන සඳහා සේවා සපයනු ලබන නිශ්චිතව සඳහන් කරන ලද යම් මෝටර් වාහනයක් සඳහා අදාළ නොවිය යුතු ය.

**23.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ මේ කොටසේ— අර්ථ නිරූපණය.

"කොමසාරිස්-ජනරාල්වරයා" යන්නෙන්, (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත යටතේ පත් කරන ලද මෝටර් වාහන කොමසාරිස්-ජනරාල්වරයා අදහස් වේ;

"රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයා" යන්නෙන්, (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ පත්කරන ලද රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයා අදහස් වේ;

"නිශ්චිතව සඳහන් කරන ලද මෝටර් වාහනය" යන්නෙන්, යම් එකලස් කරන ලද හෝ එකලස් නොකරන ලද සිලින්ඩර් ධාරිතාව 2300 සී.සී. ඉක්මවන ඩීසල් මෝටර් වාහනයක්, හෝ සිලින්ඩර් ධාරිතාව 1800 සී.සී. ඉක්මවන පෙට්‍රල් මෝටර් වාහනයක් හෝ එන්ජිමෙහි බලය කි.වො. 200 ඉක්මවන විදුලි බලයෙන් ක්‍රියා කරන වාහනයක් අදහස් වේ. නමුත් සිලින්ඩර් ධාරිතාව 2200 සී.සී. නොඉක්මවන ද්විත්ව කාර්ය පෙට්‍රල් මෝටර් වාහනයක්, ද්විත්ව කාර්ය විදුලි බලයෙන් ක්‍රියා කරන මෝටර් වාහනයක්, වෑන් රථයක්, තනි කැබ් රථයක් හෝ වැගන් රථයක් ඊට ඇතුළත් නොවිය යුතු ය.

## VIII වන කොටස

### වාහන හිමිකම් අය බද්ද පැනවීම

**24.** 2016 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, මෙහි පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති මෝටර් වාහනයක් ආනයනය කරන්නා වූ එම උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති සෑම මෝටර් වාහන ආනයනකරුවකුගෙන් ම, සුසංගත භාණ්ඩ විස්තරය සහ කේතකරණ අංක ක්‍රමය යටතේ හඳුනාගත් එක් එක් වාහන වර්ගය සඳහා එම උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති අදාළ අනුප්‍රමාණවලින් (මේ කොටසේ මින්මතු වාහන හිමිකම් අය බද්ද පැනවීම.

"අය බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) "වාහන හිමිකම් අය බද්ද" යනුවෙන් හඳුන්වනු ලබන අය බද්දක් අයකරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, එකලස් නොකරන ලද ආකාරයෙන් වාහනයක් ආනයනය කරන්නා වූ වාහන ආනයනකරුවකු අය බද්ද ගෙවීමට යටත් නොවිය යුතු ය.

2016 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2019 ජනවාරි මස 1 වන දින දක්වා වන කාලසීමාව සඳහා අය බද්ද එකතු කිරීම.

**25.** (1) 2016 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන නමුත් 2019 ජනවාරි මස 1 වන දිනයට පෙර අවසන් වන යම් කාල සීමාවක් සඳහා ගෙවිය යුතු අය බද්ද, ආනයනය කරන ලද වාහනය සම්බන්ධයෙන් ණයවර ලිපිය විවෘත කරන බැංකුව මගින් ඒ ණයවර ලිපිය විවෘත කරන අවස්ථාවේ දී එකතු කරනු ලැබිය යුතු අතර, (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති ආකාරයට එම බැංකුව විසින් කොමසාරිස්-ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

(2) බැංකුව විසින්-

(අ) යම් මාසයක 1 වන දිනයෙන් ආරම්භ වී එම මාසයේ 15 වන දිනය දක්වා වන කාලසීමාව තුළ එකතු කරනු ලබන අය බද්ද, එම මාසය අවසානයේ දී හෝ ඊට පෙර; සහ

(ආ) යම් මාසයක 16 වන දිනයෙන් ආරම්භ වී එම මාසයේ අවසානය දක්වා වන කාලසීමාව තුළ එකතු කරනු ලබන අය බද්ද, පසුව එළඹෙන මාසයේ 15 වන දිනයේ දී හෝ ඊට පෙර,

කොමසාරිස්-ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබ තිබිය යුතු ය.

(3) මෙම වගන්තියේ ඉහතින් වූ විධිවිධාන ප්‍රකාරව අය බද්ද ප්‍රේෂණය කරන්නා වූ සෑම බැංකුවක් ම, පහත සඳහන් දේ දක්වමින් ප්‍රකාශයක් කොමසාරිස්-ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය:—

(අ) එක් එක් ප්‍රේෂණයට සම්බන්ධ එක් එක් ආනයකරුවාගේ නම සහ ලිපිනය;

(ආ) වාහන වර්ගය;

(ඇ) ණයවර ලිපියේ වටිනාකම;

(ඈ) එකතු කරන ලද ප්‍රමාණය ; සහ

(ඉ) කොමසාරිස්-ජනරාල්වරයා වෙත කලින් කලට අවශ්‍ය විය හැකි වෙනත් යම් විස්තර.

(4) යම් ආනයනකරුවකුගෙන් අය බද්ද එකතු කරනු ලබන යම් බැංකුවක් විසින් අය බද්ද ගෙවූ බව සහතික කරමින් එකී ආනයනකරු වෙත ණයවර ලිපියේ පිටපතක් නිකුත් කළ යුතු ය. 2016 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව විවෘත කරන ලද ණයවර ලිපියක් මත ආනයනය කරන ලද යම් වාහනයක්, බැංකුව විසින් පිටසන් කරන ලද ණයවර ලිපියේ පිටපත ආනයනකරුවා විසින් ඉදිරිපත් කරන්නේ නම් මිස, ශ්‍රී ලංකා රේගුවෙන් ඉවත් කර ගැනීම සඳහා ඉඩ දෙනු නොලැබිය යුතු ය.

(5) ණයවර ලිපිය අවලංගු කරනු ලැබූ යම් අවස්ථාවක දී එකී ණයවර ලිපිය මත අය බද්ද ගෙවනු ලැබූ ආනයනකරු විසින් එම අය බද්ද ආපසු ගෙවන ලෙස එම අය බද්ද කොමසාරිස්-ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කිරීමට පෙරාතුව ඉල්ලා සිටිනු ලබන විට දී, බැංකුව විසින් ආපසු ගෙවනු ලැබිය හැකි ය.

2019 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා වන අය බද්ද එකතු කිරීම.

**26.** (1) 2019 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ණයවර ලිපිය විවෘත කරනු ලැබ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන යම් වාහනයකට අදාළව 2019 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා 24 වන වගන්තිය යටතේ ගෙවිය යුතු අය බද්ද, එම වාහනය ශ්‍රී ලංකා රේගුවෙන් ඉවත් කර ගනු ලබන අවස්ථාවේ දී, ආනයනකරු විසින් යම් ලිඛිත නීතියක් ප්‍රකාරව එකී වාහනයට අදාළව ගෙවිය යුතු ආනයන තීරුබදු සමඟින් රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

(2) අය බද්ද ගෙවීමෙන් පසු "වාහන හිමිකම් සහතිකය" යනුවෙන් හඳුන්වනු ලබන සහතිකයක් මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් නියම කරනු හැකි ආකෘතියකට අනුකූලව රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබිය යුතු ය.

(3) යම් රේගු බද්දක් එකතු කිරීම හා අයකර ගැනීම සම්බන්ධයෙන් අදාළ වන්නා වූ ( 235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ විධිවිධාන, මේ කොටස යටතේ වන අය බද්ද එකතු කිරීම හා අයකර ගැනීම සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

අය බද්ද ගෙවීමෙන් ඇතැම් වාහන නිදහස් බව.

**27.** 1996 අංක 9 දරන තනාපති වරප්‍රසාද පනතේ අර්ථානුකූලව යම් රාජ්‍යයක දූත මණ්ඩලයකට හෝ එම පනත ප්‍රකාරව පිළිගනු ලැබූ යම් ජාත්‍යන්තර, බහුපාර්ශ්වික හෝ ද්වීපාර්ශ්වික සංවිධානයකට සේවා සැපයීම සඳහා ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන යම් වාහනයක් සම්බන්ධයෙන් මේ කොටසේ සඳහන් කිසිවක් අදාළ නොවිය යුතු ය.

වලංගු කිරීම.

**28.** මේ පනතේ මේ කොටස ප්‍රකාරව, කොමසාරිස්-ජනරාල්වරයා වෙනුවෙන් බැංකුවක් විසින් 24 වන වගන්තිය යටතේ වන අය බද්දෙහි යම් මුදල් ප්‍රමාණයක් 2016 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී යම් මෝටර් වාහනයක් ආනයනය කරන තැනැත්තකුගෙන් එකතු කරනු ලැබ ඇති අවස්ථාවක දී සියලු කාර්යයන් සඳහා එම එකතු කිරීම වලංගු ලෙස සිදු කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, එකී එකතු කිරීමට එරෙහිව සිවිල් හෝ අපරාධ නඩු පවරනු ලැබීමෙන් බැංකුව සහ කොමසාරිස්-ජනරාල්වරයා මෙයින් විනිර්මුක්ත කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් අය බද්දේ අනුප්‍රමාණ සංශෝධනය කිරීම.

**29.** පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් මෙහි පළමුවන උපලේඛනයේ දක්වා ඇත්තා වූ ද, 24 වන වගන්තිය යටතේ ගෙවිය යුතු වූ ද අය බද්දේ අනුප්‍රමාණ සංශෝධනය කරනු ලැබිය හැකි ය.

අර්ථ නිරූපණය.

**30.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ මේ කොටසේ-

"බැංකුව" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලපත්‍රලාභී වාණිජ බැංකුවක් අදහස් වේ;

"කොමසාරිස්-ජනරාල්වරයා" යන්නෙන්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ පත් කරනු ලැබූ හෝ පත් කරනු ලැබූ ලෙස සලකනු ලබන දේශීය ආදායම් කොමසාරිස්-ජනරාල්වරයා අදහස් වේ;

"රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයා" යන්නෙන්, (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ පත් කරන ලද රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයා අදහස් වේ.

## IX වන කොටස

### වාර්ෂික සමාගම් ලියාපදිංචි කිරීමේ අය බද්ද

වාර්ෂික සමාගම් ලියාපදිංචි කිරීමේ අය බද්ද පැනවීම.

**31.** (1) 2016 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2016 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන වර්ෂය සඳහා දෙවන උපලේඛනයේ සඳහන් එක් එක් සමාගම් කාණ්ඩ සඳහා නිශ්චිතව සඳහන් අදාළ අනුප්‍රමාණ මත (මේ කොටසේ මින්මතු "අය බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) "වාර්ෂික සමාගම් ලියාපදිංචි කිරීමේ අය බද්ද" යනුවෙන් හඳුන්වනු ලබන අය බද්දක් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ සෑම සමාගමකින් ම අයකරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ වගන්තියේ විධිවිධාන -

(අ) අක්වෙරළ සමාගමක්; සහ

(ආ) ඇපයෙන් සීමිත සමාගමක්,

සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(2) සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් සෑම අදාළ සමාගමකින්ම 2019 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙර අය බද්ද එකතු කර ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

(3) මේ කොටසේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් විධිවිධාන මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් නියම කරනු ලැබිය යුතු ය.

ඇතැම් සමාගම් අය බද්ද ගෙවීමෙන් නිදහස් බව.

**32.** 31 වන වගන්තියේ විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, 2016 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2016 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරනු ලැබූ යම් සමාගමක් අය බද්ද ගෙවීමට යටත් නොවිය යුතු ය.

අය බද්ද ගෙවීම පැහැර හැරීම.

**33.** (1) 31 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි අය බද්ද ගෙවීම පැහැර හරින යම් සමාගමක්, මේ පනත යටතේ බදු පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) 34 වන වගන්තියේ වගන්තියේ විධිවිධාන එවැනි යම් බදු පැහැර හරින්නකුට විරුද්ධව නඩු පැවරීම සහ එම අය බද්ද අයකර ගැනීම සඳහා, අදාළ විය යුතු ය.

ගෙවීම පැහැර හැර ඇති අය බද්ද අයකර ගැනීම.

**34.** (1) අය බද්ද හෝ ඉන් යම් කොටසක් ගෙවීම පැහැර හැර ඇති විටක, ගෙවීම පැහැර හැර ඇති මුදල පිළිබඳ විස්තර හා සමාගමේ නම හා ලිපිනය ඇතුළත් සහතිකයක් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් එකී ස්ථානය විෂයයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) එවිට මහෙස්ත්‍රාත්වරයා විසින්, බදු පැහැර හරින්නාට එරෙහිව එසේ ගෙවීම පැහැර හරිනු ලැබූ අය බද්ද අයකර ගැනීම පිණිස නඩු කටයුතු පවත්වාගෙන නොයා යුත්තේ මන්ද යන වගට හේතු දැක්වීම සඳහා එම බදු පැහැර හරින්නා කැඳවනු ලැබිය යුතු ය.

(3) බදු පැහැර හරින්නා විසින් ප්‍රමාණවත් හේතු දැක්වීමක් කරනු නොලැබුවහොත්, එම ගෙවීම පැහැර හැර ඇති අය බද්ද ඒ පැහැර හරින්නාට මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කරන ලද දඩ මුදලක් සේ මහෙස්ත්‍රාත්වරයාගේ ආඥාවක් මගින් අයකර ගනු ලැබිය යුතු අතර, එසේ අයකර ගනු ලැබූ විට ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

වලංගු කිරීම.

**35.** මේ පනතේ මේ කොටස ප්‍රකාරව සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් 31 වන වගන්තිය යටතේ වන අය බද්දෙහි යම් මුදලක් ඒ වගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති කාල සීමාව සඳහා 2016 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් අවසන් වන කාල සීමාව තුළ දී 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කළ හෝ ලියාපදිංචි කළ

යම් සමාගමකින් එකතු කරනු ලැබ ඇති අවස්ථාවක දී, සියලු කාර්යයන් සඳහා එම එකතු කිරීම වලංගු ලෙස සිදු කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, එකී එකතු කිරීමට එරෙහිව සිවිල් හෝ අපරාධ නඩු පවරනු ලැබීමෙන් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා මෙයින් විනිර්මුක්ත කරනු ලැබේ

## X වන කොටස

### ණය ආපසු ගෙවීමේ අය බද්ද

ණය ආපසු ගෙවීමේ අය බද්ද පැනවීම.

**36.** (1) 2018 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් ආරම්භ වන නමුත් 2021 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන සෑම මාසයක් සඳහා ම සෑම මුල්‍ය ආයතනයකින් ම, ඒ එක් එක් මුල්‍ය ආයතනය විසින් සපයන මුල්‍ය සේවාවන්ට ආරෝපණය කළ හැකි එකතු කළ අගය මත (මේ කොටසේ මින්මතු "අය බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) "ණය ආපසු ගෙවීමේ අය බද්ද" යනුවෙන් හඳුන්වනු ලබන සියයට 7 ක් වන අය බද්දක් අයකරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා සපයනු ලබන මුල්‍ය සේවාවන්ට ආරෝපණය කළ හැකි එකතු කළ අගය, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 25ඇ වන වගන්තියේ නිශ්චිතව සඳහන් විධිවිධාන මත පදනම්ව, ගණන් බැලිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ සපයනු ලබන මුල්‍ය සේවාවන්ට ආරෝපණය කළ හැකි එකතු කළ අගය ගණනය කිරීම සඳහා සැලකිල්ලට ගනු ලබන මුල්‍ය ආයතනයේ මෙහෙයුම් ලාභයේ හෝ පාඩුවේ ප්‍රමාණය, මෙම වගන්තිය යටතේ ගෙවිය යුතු බද්ද, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 25අ වන වගන්තිය යටතේ ගෙවිය යුතු එකතු කළ අගය මත බද්ද සහ 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ (2) වන උපවගන්තියේ (iii) වන ඡේදය යටතේ ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බද්ද යන බදු අඩු කිරීමට පෙරාතුව එකී මුල්‍ය ආයතනයේ ලාභයේ හෝ පාඩුවේ ප්‍රමාණය විය යුතු ය.

(4) සෑම මාසයක් සඳහා ම වන අය බද්ද, එම ප්‍රේෂණයට අදාළ අගය එකතුවීමේ ප්‍රකාශයක් සමග අදාළ මාසයෙන් පසු එළඹෙන මාසයේ විසිවන දින හෝ ඊට පෙර, කොමසාරිස්-ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

(5) මුල්‍ය ආයතනයක් විසින්, එම මුල්‍ය ආයතනයේ එක් එක් මුදල් වර්ෂය සම්බන්ධයෙන් වාර්තාවක්, ඒ මුදල් වර්ෂයේ අවසානයේ සිට මාස හයක කාල සීමාවක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන යම් ආකෘතියකින් ඉදිරිපත් කළ යුතු ය.

අය බද්දෙන් නිදහස් කිරීම.

**37.** අමාත්‍යවරයා විසින්, රටේ ආර්ථික සංවර්ධනය සැලකිල්ලට ගනිමින්, *ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලබන නියමයක් මගින්, එකී නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් කොන්දේසියකට යටත් ව, එකී නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන මුල්‍ය ආයතනයක යම් ගනුදෙනුවක්, මේ කොටස යටතේ ගෙවිය යුතු අය බද්ද ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

අය බද්ද ගෙවීම පැහැර හැරීම.

**38.** (1) මේ කොටස යටතේ අය බද්ද ගෙවීමට යටත් යම් මුල්‍ය ආයතනයක් 36 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි අය බද්ද ගෙවීම පැහැර හරින අවස්ථාවක දී, එකී මුල්‍ය ආයතනය මේ පනත යටතේ බදු පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) එවැනි යම් බදු පැහැර හරින්නකුට සහ ඔහු සම්බන්ධයෙන් 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ IX වන පරිච්ඡේදයේ, XI වන පරිච්ඡේදයේ, XII වන පරිච්ඡේදයේ, XIII වන පරිච්ඡේදයේ, XIV වන පරිච්ඡේදයේ, XV වන පරිච්ඡේදයේ, XVI වන පරිච්ඡේදයේ, XVII වන පරිච්ඡේදයේ සහ XVIII පරිච්ඡේදයේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

අර්ථ නිරූපණය.

**39.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ මේ කොටසේ -

"කොමසාරිස්-ජනරාල්වරයා" යන්නෙන්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ පත් කරන ලද හෝ පත්කරන ලදැයි සලකනු ලබන දේශීය ආදායම් කොමසාරිස්-ජනරාල්වරයා අදහස් වේ;

"මුල්‍ය ආයතනය" යන්නෙන්-

(අ) 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්;

(ආ) 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී මුදල් සමාගමක්,

අදහස් වේ.

XI වන කොටස

**කාබන් බද්ද**

**40.** (1) 2019 ජනවාරි මස 1 වන දින සිට ආරම්භවන සෑම වර්ෂයක් සඳහා ම, මෙහි තුන්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති සෑම මෝටර් වාහනයක ම ලියාපදිංචි අයිතිකරුගෙන්, (මේ කොටසේ මින්මතු "බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) "කාබන් බද්ද" යනුවෙන් හඳුන්වනු ලබන බද්දක් ඒ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති අනුප්‍රමාණවලින් අය කරනු ලැබිය යුතු ය. කාබන් බද්ද පැනවීම.

(2) (1) වන උපවගන්තිය යටතේ පනවනු ලද බද්ද විදුලි බලයෙන් ක්‍රියා කරන වාහන සඳහා අදාළ නොවිය යුතු ය.

**41.** (1) යම් අදාළ වාහනයක ලියාපදිංචි අයිතිකරු විසින්, එකී මෝටර් වාහනය ලියාපදිංචි කරන ලද පළමු වර්ෂය සඳහා හැර සෑම වර්ෂයක් සඳහා ම, වාර්ෂික ලියාපදිංචි කිරීම අලුත් කළ යුතු දින හෝ එදිනට පෙර, ප්‍රාදේශීය ලේකම්වරයා වෙත බද්ද ගෙවනු ලැබිය යුතු ය. ලියාපදිංචි අයිතිකරු බද්ද ගෙවිය යුතු බව.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව යම් මුදල් ප්‍රමාණයක් එකතු කරනු ලබන සෑම ප්‍රදේශීය ලේකම්වරයකු විසින් ම, නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකින්, එසේ එකතු කරන ලද බද්ද ලැබුණු බව නිසි ලෙස පිළිගනු ලැබිය යුතු අතර, එම මුදල් ප්‍රමාණය කොමසාරිස්-ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

(3) මේ කොටසේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට සහ බද්ද එකතු කිරීමට අවශ්‍ය විය හැකි විධිවිධාන මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් නියම කරනු ලැබිය යුතු ය.

බද්දේ අනුප්‍රමාණ පාර්ලිමේන්තු යෝජනා සම්මතයක් මගින් සංශෝධනය කිරීම.

**42.** 40 වන වගන්තිය යටතේ ගෙවිය යුතු සහ මෙහි තුන්වන උපලේඛනයේ දක්වා ඇති බද්දේ අනුප්‍රමාණ පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් සංශෝධනය කරනු ලැබිය හැකි ය.

අර්ථ නිරූපණය.

**43.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ මේ කොටසේ-

''කොමසාරිස්-ජනරාල්වරයා'' යන්නෙන්, (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත යටතේ පත් කරන ලද මෝටර් වාහන කොමසාරිස්-ජනරාල්වරයා අදහස් වේ.

XII වන කොටස

**දුරකථන සන්නිවේදන කුළුණු අය බද්ද**

දුරකථන සන්නිවේදන කුළුණු අය බද්ද පැනවීම.

**44.** (1) 2019 ජනවාරි මස 1 වන දින සිට ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම, දුරකථන සන්නිවේදන කුළුණක් හිමි සෑම ජංගම දුරකථන ක්‍රියාකරුවකුගෙන් ම, එක් එක් දුරකථන සන්නිවේදන කුළුණක් සඳහා වර්ෂයකට රුපියල් ලක්ෂ දෙකක් වන (මේ කොටසේ මින්මතු ''අය බද්ද'' යනුවෙන් සඳහන් කරනු ලබන) ''දුරකථන සන්නිවේදන කුළුණු අය බද්ද'' යනුවෙන් හඳුන්වනු ලබන අය බද්දක් අය කරනු ලැබිය යුතු ය.

(2) එවැනි ජංගම දුරකථන ක්‍රියාකරුවකු විසින් (මේ කොටසේ මින්මතු ''කොමිෂන් සභාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත අය බද්ද, සමාන වාරික හතරකින් පිළිවෙළින් පහත දැක්වෙන ආකාරයට ගෙවිය යුතු ය:-

(අ) පළමුවන වාරිකය අදාළ වර්ෂයේ අප්‍රේල් මස පහළොස්වන දින හෝ එදිනට පෙර;

(ආ) දෙවන වාරිකය අදාළ වර්ෂයේ ජූලි මස පහළොස්වන දින හෝ එදිනට පෙර;

(ඇ) තෙවන වාරිකය අදාළ වර්ෂයේ ඔක්තෝබර් මස පහළොස්වන දින හෝ එදිනට පෙර;

(ඇ) හතරවන වාරිකය අදාළ වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන වර්ෂයේ ජනවාරි මස පහළොස්වන දින හෝ එදිනට පෙර.

(3) (අ) යම් ජංගම දුරකථන ක්‍රියාකරුවකුට අයත් නොවන යම් දුරකථන කුළුණක් සම්බන්ධයෙන්, (1) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු අය බද්ද, එම දුරකථන කුළුණ භාවිත කරන ජංගම දුරකථන ක්‍රියාකරුගෙන් අය කරනු ලැබිය යුතු ය.

(ආ) ජංගම දුරකථන ක්‍රියාකරුවන් එක් අයකුට වඩා දුරකථන කුළුණක් භාවිත කරන අවස්ථාවක දී, එම ජංගම දුරකථන ක්‍රියාකරුවන් විසින් එම අය බද්ද සමාන කොටස්වලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) එකතු කරන ලද අය බද්දෙහි මුදල් ප්‍රමාණය කොමිෂන් සභාව විසින් එකතු කිරීමේ දින සිට දින පහළොවක් ඇතුළත ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

**45.** (1) 44 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි අය බද්ද ගෙවීම පැහැර හරින යම් ජංගම දුරකථන ක්‍රියාකරුවකු, මේ පනත යටතේ බදු පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය. අය බද්ද ගෙවීම පැහැර හැරීම.

(2) එවැනි යම් බදු පැහැර හරින්නකුට එරෙහිව නඩු පැවරීමට සහ එසේ පැහැර හරින ලද බද්ද අය කර ගැනීම සහ ඒ සම්බන්ධයෙන් 46 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

**46.** (1) අය බද්ද හෝ එයින් යම් කොටසක් ගෙවීම පැහැර හරිනු ලැබ ඇති විට, ගෙවීම පැහැර හැර ඇති බදු මුදල් ප්‍රමාණයද, බදු පැහැර හරින්නාගේ නම සහ අවසන් වතාවට දන සිටි පදිංචි ස්ථානයේ හෝ ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය පිළිබඳ විස්තර ඇතුළත් වන සහතිකයක්, කොමිෂන් සභාව විසින්, එකී ස්ථානය විෂයයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය. පැහැර හරින ලද අය බද්ද අය කර ගැනීම.

(2) එවිට මහෙස්ත්‍රාත්වරයා විසින්, බදු පැහැර හරින්නාට එරෙහිව එසේ ගෙවීම පැහැර හැර ඇති අය බදු මුදල අය කර ගැනීම පිණිස නඩු කටයුතු පවත්වාගෙන නොයා යුත්තේ මන්ද යන වගට හේතු දක්වීම සඳහා බදු පැහැර හරින්නා කැඳවනු ලැබිය යුතු ය.

(3) බදු පැහැර හරින්නා විසින්, ප්‍රමාණවත් හේතු දැක්වීමක් කරනු නොලැබුවහොත්, එසේ ගෙවීම පැහැර හැර ඇති අය බදු මුදල ඒ පැහැර හරින්නාට මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කරන ලද දඩ මුදලක් සේ මහෙස්ත්‍රාත්වරයාගේ ආඥාවක් මඟින් අය කර ගනු ලැබිය යුතු අතර, එසේ අය කර ගනු ලැබූ විට ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා කොමිෂන් සභාව වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

**47.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ මේ කොටසේ -

''ජංගම දුරකථන ක්‍රියාකරු'' යන්නෙන්, 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලිසංදේශ පනතේ 17 වන වගන්තිය යටතේ බලපත්‍රලත් ක්‍රියාකරුවකු අදහස් වේ;

''දුරකථන සන්නිවේදන කුළුණ'' යන්නෙන්, ඇන්ටනා සහ ඉලෙක්ට්‍රෝනික සන්නිවේදන උපකරණ ස්ථානගත කර ඇති දුරකථන සන්නිවේදන ස්ථානයක් අදහස් වේ;

''විදුලිසංදේශ නියාමන කොමිෂන් සභාව'' යන්නෙන්, 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලිසංදේශ පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා විදුලිසංදේශ නියාමන කොමිෂන් සභාව අදහස් වේ;

## XIII වන කොටස

### ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවා මත අය බද්ද පැනවීම

ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවා මත අය බද්ද පැනවීම.

**48.** (1) 2019 ජනවාරි මස 1 වන දින සිට බලපවත්වන පරිදි ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවා හරහා විශාල සංඛ්‍යාවකින් යවනු ලබන ප්‍රචාරක දැන්වීම් මත, එක් එක් ජංගම දුරකථන කෙටි පණිවුඩයකට ශත 25 ක අය බද්දක් අය කරනු ලැබිය යුතු ය.

(2) අය බද්ද අය කරනු ලබන්නේ යම් ජංගම දුරකථන කෙටි පණිවුඩයක් සම්බන්ධයෙන් ද, එම ජංගම දුරකථන කෙටි පණිවුඩය මගින් දැන්වීමක් ප්‍රචාරය කිරීමට අදහස් කරන දැන්වීම්කරු විසින් (1) වන උපවගන්තිය යටතේ පනවන ලද අය බද්ද, ගෙවනු ලැබිය යුතු ය.

(3) අය බද්ද එකතු කිරීමේ සහ අය කර ගැනීමේ ආකාරය නිශ්චිතව දක්වමින් සහ මේ පනතේ මේ කොටසේ විධිවිධාන ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ විධිවිධාන සලසමින් මේ පනත යටතේ නියෝග සාදනු ලැබිය යුතු ය.

**49.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ මේ කොටසේ- අර්ථ නිරූපණය.

''ජංගම දුරකථන කෙටි පණිවුඩය'' යන්නෙන්, ජංගම දුරකථන හරහා යවනු ලබන වචන ඇතුළත් පණිවුඩයක් අදහස් වේ;

''විශාල සංඛ්‍යාවකින් යවනු ලබන ප්‍රචාරක දැන්වීම්'' යන්නෙන්, වාණිජ පරමාර්ථ සඳහා ලැබුම්කරුවන් සමූහයක් වෙත ජංගම දුරකථන හරහා යවනු ලබන පණිවුඩ අදහස් වේ.

## XIV වන කොටස

### සාමාන්‍ය

**50.** මේ පනත යටතේ පනවන ලද අය බද්දක් හෝ බද්දක් ගෙවීම, පුද්ගල මණ්ඩලයක් විසින් පැහැර හරිනු ලැබූ විට, එම පුද්ගල මණ්ඩලය - පුද්ගල මණ්ඩල විසින් බදු පැහැර හැරීම.

(අ) සංස්ථාපිත මණ්ඩලයක් නම්, ඒ සංස්ථාපිත මණ්ඩලයේ කළමනාකරණය සහ පාලනය කෙරෙහි වගකීමක් ඇති සෑම අධ්‍යක්ෂවරයකු ම සහ නිලධරයකු ම; හෝ

(ආ) වෙළෙඳ ව්‍යාපාරයක් නම්, ඒ වෙළෙඳ ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකු ම; හෝ

(ඇ) වෙළෙඳ ව්‍යාපාරයක් නොවන සංස්ථාපිත නොකළ පුද්ගල මණ්ඩලයක් නම්, ඒ පුද්ගල මණ්ඩලයේ කළමනාකරණය සහ පාලනය කෙරෙහි වගකීමක් ඇති සෑම නිලධරයකු ම,

මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි ඒ අය බද්ද හෝ බද්ද අය කරගනු ලැබීම සඳහා නඩු පවරනු ලැබීමට යටත් විය යුතු ය.

නියෝග.

**51.** (1) නියම කළ යුතු යැයි මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනත යටතේ බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරන ලද දිනයෙහි හෝ එහි නිශ්චිතව සඳහන් යම් පසු දිනයක හෝ බලාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, එය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ යටතේ යථාපරිදි කරන ලද කිසිවකට ඉන් අගතියක් නොවිය යුතු ය.

(4) නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**52.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

(24 වන වගන්තිය)

**පළමුවන උපලේඛනය**

| | | රේගු කාර්යය සඳහා සුසංගත භාණ්ඩ විස්තරය සහ කේතකරණ අංක ක්‍රමය යටතේ හඳුනාගත් වාහන කාණ්ඩ | ප්‍රමාණය (වාහනයකට රුපියල්) |
|---|---|---|---|
| 1. | | ත්‍රිරෝද රථ, ට්‍රැක්ටර් සහ යතුරුපැදි | 2,000/- |
| 2. | (අ) | 1 වන අයිතමයේ සඳහන් කළ වාහන නොවන ප්‍රධාන වශයෙන් තැනැත්තන් ප්‍රවාහනය කිරීම සඳහා සැලසුම් කරන ලද මෝටර් කාර් සහ වෙනත් මෝටර් වාහන | 15,000/- |
| | (ආ) | මගී කැබ් රථ, ද්විත්ව කැබ් රථ සහ භාණ්ඩ ප්‍රවාහන වෑන් රථ | |
| 3. | | ඉහත 1 වන හා 2 වන අයිතමයන් මගින් පහත දැක්වෙන වාහන ආවරණය කරනු නොලැබේ | 10,000/- |
| | (අ) | ප්‍රධාන වශයෙන් තැනැත්තන් හා භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා සැලසුම් කරන ලද වාහන නොවන විශේෂ කාර්ය වාහන | |
| | (ආ) | මෝටර් යෙදූ හෝ නොයෙදූ හෝ වෙනත් ආකාරයකින් යාන්ත්‍රිකව පදවනු ලබන ආබාධ සහිත තැනැත්තන් සඳහා වන වාහන | |

(31 වන වගන්තිය)

**දෙවන උපලේඛනය**

| සමාගම් කාණ්ඩය | අනුප්‍රමාණය (වර්ෂයකට රුපියල්) |
|---|---|
| පුද්ගලික සමාගම් | 30,000/- |
| ලයිස්තුගත පොදු සමාගම් | 1,500,000/- |
| වෙනත් යම් සමාගම් | 250,000/- |

(40 වන වගන්තිය)

**තුන්වන උපලේඛනය**

| වාහනයේ කාණ්ඩය | අනුප්‍රමාණය (රුපියල්) | | |
|---|---|---|---|
| | වසර 5 ට අඩු | වසර 5 සිට 10 දක්වා | වසර 10 වැඩි |
| දෙමුහුන් (පෙට්‍රල්/ ඩීසල්) | ඝන සෙ.මී. ට 0.25 | ඝන සෙ.මී. ට 0.50 | ඝන සෙ.මී. ට 1.00 |
| ඉන්ධන (පෙට්‍රල්/ඩීසල්) | ඝන සෙ.මී. ට 0.50 | ඝන සෙ.මී. ට 1.00 | ඝන සෙ.මී. ට 1.50 |
| මගී බස් රථ | රු. 1,000/- | රු. 2,000/- | රු. 3,000/- |

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.